05
පාඩම
पञ्चमः पाठः

# විභක්ති - 01
# (ප්‍රථමා විභක්තිය)

## ප්‍රථමා විභක්තිය

වාක්‍යයක ක්‍රියාවෙන් කියැවෙන, ප්‍රකාශවන පදය උක්තය වශයෙන් හැඳින්වේ. උක්තය ප්‍රථමා විභක්තියෙන් තැබේ.

| | |
|---|---|
| कुमारः | → लिखति |
| लेखकः | → लिखति |
| आचार्यः | → लिखति |

ඉහත සඳහන් වාක්‍ය තුනේ **लिखति** (ලියයි) යන ක්‍රියාව කරන්නා කර්තෘ ය. ඒ අනුව '**कुमारः, लेखकः, आचार्यः**' යන නාම පද තුන ම කර්තෘවරු වෙත්. වරනැගෙන්නේ ප්‍රථමා විභක්තියෙහි ය.

| | | |
|---|---|---|
| 1 | नृपः रक्षति । | (රජතුමා ආරක්ෂා කරයි.) |
| 2 | श्रामणेरः नमति। | (සාමණේරයන් වහන්සේ නමදියි.) |
| 3 | दायकः वन्दति । | (දායකයා වඳියි.) |
| 4 | बिडालः पिबति । | (බළලා බොයි.) |
| 5 | मूषिकः धावति । | (මීයා දුවයි.) |

**නාමපදවල වචන භේදය හඳුනාගනිමු.**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | नरः | (මිනිසා) | → | नराः | (මිනිස්සු) |
| 2 | लेखकः | (ලියන්නා) | → | लेखकाः | (ලියන්නෝ) |
| 3 | कर्षकः | (ගොවියා) | → | कर्षकाः | (ගොවියෝ) |
| 4 | हंसः | (හංසයා) | → | हंसाः | (හංසයෝ) |
| 5 | गायकः | (ගයන්නා ) | → | गायकाः | (ගයන්නෝ) |

වරනැඟීම

## 5.1 ක්‍රියාකාරකම

අකාරාන්ත පුල්ලිංග **बालक** ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | बालकः | बालकौ | बालकाः |
| | ළමයා | ළමයි දෙදෙන | ළමයි |
| सम्बोधन | हे बालक | हे बालकौ | हे बालकाः |
| | පින්වත් ළමයා | පින්වත් ළමයි දෙදෙනනි | පින්වත් ළමයිනි |
| द्वितीया | बालकम् | बालकौ | बालकान् |
| | ළමයා | ළමයින් දෙදෙනා | ළමයින් |
| तृतीया | बालकेन | बालकाभ्याम् | बालकैः |
| | ළමයා විසින් | ළමයින් දෙදෙනා විසින් | ළමයින් විසින් |
| चतुर्थी | बालकाय | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාට | ළමයින් දෙදෙනාට | ළමයින්ට |
| पञ्चमी | बालकात् | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාගෙන් | ළමයින් දෙදෙනාගෙන් | ළමයින්ගෙන් |
| षष्ठी | बालकस्य | बालकयोः | बालकानाम् |
| | ළමයාගේ | ළමයින් දෙදෙනාගේ | ළමයින්ගේ |
| सप्तमी | बालके | बालकयोः | बालकेषु |
| | ළමයා කෙරෙහි | ළමයින් දෙදෙනා කෙරෙහි | ළමයින් කෙරෙහි |

## 5.2 ක්‍රියාකාරකම

**बालक** ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද පාඩම් කර වරනගමු.

नर - මිනිසා  नृप - රජතුමා  सचिव - ඇමති

आचार्य - ගුරුවරයා  लेखक - ලේඛකයා  जनाधिप - ජනපති

जनक - පියා  अग्रज - අයියා  अनुज - මල්ලී

| | | | | | |
|---|---|---|---|---|---|
| श्रमण | - භික්ෂුව | वाणिज | - වෙළෙන්දා | महाशय | - මහත්මයා |
| कर्षक | - ගොවියා | गोपाल | - ගොපල්ලා | दरिद्र | - දිළින්දා |
| भृत्य | - සේවකයා | पथिक | - මගියා | दारक | - ළදරුවා |
| अर्क | - ඉර | मेघ | - වලාකුළ | उटज | - පැල |
| व्रज | - ගාල | कासार | - විල | केदार | - කුඹුර |
| सारमेय | - බල්ලා | मार्जार | - බළලා | गर्दभ | - කොටළුවා |
| चित्रक | - කොටියා | वराह | - ඌරා | मर्कट | - රිළවා |
| मूषिक | - මීයා | शृगाल | - හිවලා | भल्लूक | - වලසා |
| शशक | - සාවා | वायस | - කවුඩා | बक | - කොකා |
| शकुन | - කුරුල්ලා | भृङ्ग | - මීමැස්සා | हंस | - හංසයා |
| मकरन्द | - මල්පැණි | मोदक | - රසකැවිල්ල | अपूप | - ආප්පය |
| गायक | - ගායකයා | | | | |

පුරුෂ තුනට අයත් **උක්ත** වශයෙන් යෙදෙන ප්‍රථමා **විභක්තිපද** පහත දැක්වේ.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथम पुरुष | सः | तौ | ते |
| | හෙතෙම | ඔවුහු දෙදෙන | ඔවුහු |
| मध्यम पुरुष | त्वम् | युवाम् | यूयम् |
| | නුඹ | නුඹලා දෙදෙන | නුඹලා |
| उत्तम पुरुष | अहम् | आवाम् | वयम् |
| | මම | අපි දෙදෙන | අපි |

## 5.1 අභ්‍යාසය

1. **बालक** ශබ්දය ඇසුරෙන් ඔබ කැමති **ශබ්ද දෙකක්** වරනැඟා දක්වන්න.

2. පහත දැක්වෙන ශබ්දවල හිස්තැනට අදාළ ප්‍රථමා විභක්තිපද දක්වන්න.

| | | | | |
|---|---|---|---|---|
| උදා: | नृप | - | प्रथमा बहुवचन | नृपाः |
| १ | वाणिज | - | प्रथमा द्विवचन | ........................... |
| २ | चन्द्र | - | प्रथमा एकवचन | ........................... |
| ३ | सचिव | - | प्रथमा बहुवचन | ........................... |
| ४ | शृगाल | - | प्रथमा द्विवचन | ........................... |
| ५ | मूषिक | - | प्रथमा एकवचन | ........................... |

## 5.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍යවල ඇති, ඒ ඒ පුරුෂවලට අයත් ප්‍රථමා විභක්තිපද **පුරුෂ** හා **වචන** වශයෙන් වෙන් කොට දක්වන්න.

१ सः वदति ।
२ वराहः खनति ।
३ अहं नमामि ।
४ तौ पचतः ।
५ त्वं क्रीडसि ।
६ शिष्याः लिखन्ति ।
७ युवां हसथः ।
८ आवां धावावः ।
९ ते पिबन्ति ।
१० शकुनौ कूजतः ।
११ जनाधिपः आगच्छति ।
१२ यूयम् इच्छथ ।

### භාවිතයට

**अहिंसा परमो धर्मः - तथाहिंसा परो दमः ।**
**अहिंसा परमं दानं - अहिंसा परमस्तपः ॥**

අහිංසාව උතුම් ම දහම යි. එසේ ම අහිංසාව උතුම් හික්මීම යි.
අහිංසාව උතුම් දානය යි. අහිංසාව උතුම් තපස යි.